# ඒකකය 1 - පාසල් සංස්කෘතිය

1) පාසල් සංස්කෘතියට අයත් අංග මොනවාද ?
    - පාසලේ පවත්නා නීතිරීති,සම්ප්‍රදායන්, සිරිත් විරිත්
    - පාසලේ අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත

2) පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු මොනවාද ?

- පාසලෙහි හොඳ ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම සඳහා
- පාසල ක්‍රමවත්ව පාලනය කිරීම සඳහා
- ළමයින් විනය ගරුක පුද්ගලයන් බවට පත්කිරීම සඳහා
- පාසලේ සියලු දෙනාගේම අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කිරීම සඳහා
- පාසලේ අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා

3) ළමයින් සම්බන්ධව පාසලක පවතින පොදු නීති රීති සඳහන් කරන්න.

- දිනපතා පාසලට පැමිණීම
- පාසල ආරම්භ කරන වෙලාවට පෙර පාසලට පැමිණීම
- නියමිත නිල ඇඳුමින් සැරසී පාසලට පැමිණීම
- පාසල් පැවැත්වෙන කාල සීමාවෙහි පාසලෙහි රැඳී සිටීම
- කාල සටහන අනුව අධ්‍යාපන කටයුතුවල යෙදීම

4) පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත මොනවාද ?
- ආදර්ශ පාඨය
- පාසල් ලාංඡනය
- පාසල් කොඩිය

5) පාසල් කොඩිය භාවිතා කරන අවස්ථා වලට නිදසුන්
- පාසලේ උදෑසන රැස්වීමේ දී
- නිවාසාන්තර ක්‍රීඩා උත්සවවල දී
- පාසලේ පවැත්වෙන වෙනත් විශේෂ උත්සවවල දී

6) පාසල් ගීතය තුළින් ඉටුවන මෙහෙය කුමක්ද ?

- පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය පිළිබඳ සිතුවිලි ළමයින් තුළ ජනිත කිරීම
- ළමයින් තුළ තම පාසල පිළිබඳ ගෞරවය, අභිමානය හා ආදරය ඇති වීම
- පාසලේ අනන්‍යතාවය පිළිබිඹු වීම

7) පාසල් ගීතය ගායනා කිරීමේදී අනුගමනය කළ යුතු ඉරියව් මොනවාද ?

- පාසල් ගීතය මතකයෙන් තාලයට ගායනා කිරීම
- පාසල් ගීතයට නිසි ගෞරවයක් දැක්වෙන අයුරින් අභිමානයෙන් යුතුව ගායනා කිරීම
- සීරුවෙන් සිටිමින් ගායනා කිරීම
- පාසල් ගීතය ගායනා කරන අවස්ථාවේදී වෙනත් කිසිදු කාර්යකට අවධානය යොමු නොකිරීම

8) පාසලේ දැක්ම තුළින් ප්‍රකාශ වන්නේ කුමක්ද ?

- පාසල අනාගතයේදී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ